# Epidemiology Unit
## Ministry of Health

231, De Saram Place, Colombo 01000, Sri Lanka
Tele: (+94 11) 2695112, 4740490, 4740491, 4740492 2681548 Fax: (+94 11) 2696583
email: chepid@sltnet.lk, epidunit@sltnet.lk Web: www.epid.gov.lk


## ලිස්ටීරියෝසිස්

පසුගිය පෙබරවාරි මාසයේ අගභාගයේදී මැදිවයසේ පසුවූ කාන්තාවක් ලිස්ටීරියෝසිස් රෝගයේ සංකූලතා නිසා මරණයට පත්වූ බවට රත්නපුර මහරෝහලින් වාතර්ා විය. මෙම කාන්තාව ශ්‍රී පාදය ආශ්‍රිතව රැකියාවක නිරතව තිබිණි. මේ කාලසීමාව අතරතුරදීම ශ්‍රී පාදය වන්දනා කළ තවත් දෙදෙනකු මරණයට පත්වූ බවට සඳහන් වීමත් සමග මෙම රෝගය පිළිබඳ සමාජයේ කතාබහක් ඇති වී ඇත. කෙසේ නමුත් එම දෙදෙනාගේ මරණවලට හේතුව ලිස්ටීරියෝසිස් බවට තවමත් තහවුරු වී නොමැත. දැනට පශ්චාත් මරණ පරීක්ෂණ සාම්පල අදාල අංශ මගින් පරීක්ෂා කෙරෙමින් පවතියි.

Listeriosis/ ලිස්ටීරියෝසිස් යනු Listeria monocytogenes නම් බැක්ටීරියාව නිසා ඇති වන ආහාර මගින් බෝවන රෝගයකි. මෙය බහුලවම ඇති වන්නේ නිසි ලෙස සකස් නොකරන ලද මස්, අමුකිරි හෝ පැස්ටරීකරණය නොකළ කිරි මගින් නිපදවන ලද අයිස් ක්‍රීම්, යෝගට් වැනි නිෂ්පාදනය අනුභව කිරීමෙනි. එය විටින් විට මතුවන බැක්ටීරියා ආසාදනයකි. නිරෝගී පුද්ගලයන් ලිස්ටීරියා ආසාදනයෙන් රෝගාතුර වන්නේ කලාතුරකිනි. නමුත් මෙම රෝගය නූපන් ළදරුවන්ට, අලුත උපන් බිළිඳුන්ට සහ දුවර්ල ප්‍රතිශක්තිකරණ පද්ධතියක් ඇති පුද්ගලයින්ට මාරාන්තික විය හැකිය. එබැවින් ගභර්නී කාන්තාවන්, වයස අවුරුදු 65 ට වැඩි පුද්ගලයින් සහ දුවර්ල ප්‍රතිශක්තිකරණ පද්ධතියක් ඇති පුද්ගලයින් අවදානම් කණ්ඩායම් වේ. ලිස්ටීරියාව බහුලවම පෙන්නුම්කරන සංකූලතාවන්නේ මස්තිෂ්ක ප්‍රදාහය (Encephalitis) හෝ මස්තිෂ්ක පටල ප්‍රදාහය (Meningoencephalitis) වේ. ඉක්මන් රෝග විනිශ්චය සහ ප්‍රතිජීවක ප්‍රතිකාර මගින් ලිස්ටීරියා ආසාදනයේ බලපෑම් පාලනය කිරීමට හැකි වේ.

වසංගත රෝග විද්‍යා අංශය මගින් මේ පිළිබඳ විමශර්න කෙරෙමින් පවතියි. ක්ෂේත්‍ර මට්ටමින් දැනටමත් ආහාර සාම්පල සහ ජල මූලාශ්‍ර වලින් සාම්පල ලබාගෙන විශ්ලේෂණය සඳහා යොමුකර ඇත. වසංගත රෝග විද්‍යා අංශය මගින් දැනට කරන ලද පරීක්ෂණ වලින් ලද දත්ත වලට අනුව දැනට ලිස්ටීරියෝසිස් වසංගත තත්ත්වයක් රටතුල නොමැති අතර ඒ පිළිබඳ ජනතාව අනිසි බියක් ඇති කර ගත යුතු නොවේ.

**වසංගත රෝග විද්‍යා අංශය - සෞඛ්‍ය අමාත්‍යාංශය**